*සැ. යු.* —2024.11.08 දින පළ කරන ලද අංක 2410 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,411 - 2024 නොවැම්බර් මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2024.11.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස : අධිකරණ

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් … … | |
| පනත් කෙටුම්පත් … … | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් … … | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් … … | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් … … | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් … … | — |
| පිස්කල් විකිණීම … … | 472 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් … … | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් … … | — |
| නොතාරිස් ලැයිස්තුව … … | — |
| විවිධ දැන්වීම් … … | 473 |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 දෙසැම්බර් 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 නොවැම්බර් මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

### කොළඹ දිසා අධිකරණයේ දී ය

එලායන්ස් ෆිනෑන්ස් කම්පැනි පී. එල්. සී.
අංක 84, වෝඩ් පෙදෙස, කොළඹ 07.

*..............පැමිණිලිකරු.*

නඩු අංකය : DMB/64/19
ඇස්කිසි අංකය :
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 11,692,096.49

*එදිරිව*

ගන්ගොඩ තේනබඳුගේ උදේශ් නිරංජ පෙරේරා,
අංක 290/ඒ/1, රෝහල පාර,
කිරිබත්ගොඩ.

*.................විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ **2023 ක් වූ නොවැම්බර් මස 10 වන දින** ඇතුළත් කරන ලද ඒක පාර්ශ්වික තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරුට විරුද්ධව තීන්දු ප්‍රකාශ කර ඇති අතර,

(අ) ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් එක්කෝටි දහසය ලක්ෂ අනූ දෙදහස් අනූ හයයි ශත හතලිස් නවයක (රු. 11,692,096.49) මුදල හා ඒ මත පොලිය ගෙවීමට පැහැරහැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබා දෙන ලෙසත්,

(ආ) විත්තිකරු ඉහත රුපියල් එක්කෝටි දහසය ලක්ෂ අනූ දෙදහස් අනූ හයයි ශත හතලිස් නවයක (රු. 11,692,096.49) යන මුදල හා නෛතික පොලිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඩී. එෆ්. ඒ. ගුණවර්ධන මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 3102 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබාදෙන ලෙසත්,

(ඇ) නඩු ගාස්තු ලබා දෙන ලෙසත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024 ක් වූ දෙසැම්බර් මස 05** වැනි දින පෙ.ව. **11.00** ට,

ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් උපලේඛනයේ සඳහන් නිශ්චල දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 495 වෙල්ලන්ගිරිය ග්‍රාම නිලධාරි වසම තුළ හෝකන්දර දකුණ පිහිටි ''වෙල්ලන්ගිරිය එස්ටේට්'' නැමැති ඉඩමය බලයලත් මිනින්දෝරු අයි. ටී. මාදොළ මහතා විසින් මැන සාදන ලද අංක 2003/43 සහ 2003.01.30 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 85 සඳහා මායිම් : උතුරට : ලොට් 84 සහ R11 ද, නැගෙනහිරට : ලොට් 86 ද, දකුණට : රජයේ ඉඩම් PP CO 7260 සහ PP CO 7261 සහ ලොට් 83 ද, බටහිරට : ලොට් 83 සහ ලොට් 84 ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් එකොළහක (පර්. 11) ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ ආදී සියලු දේද වේ. (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 597/08 හි ලියාපදිංචි වී ඇත. දැන් කඩුවෙල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 597/08 හි ලියාපදිංචි වී ඇත.)

*මාර්ග පරවශතා අයිතිය.-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 495 වෙල්ලන්ගිරිය ග්‍රාම නිලධාරි වසම තුළ, හෝකන්දර දකුණ පිහිටි වෙල්ලන්ගිරිය එස්ටේට් නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. ටී. මාදොළ මහතා විසින් මැන සාදන ලද අංක 2003/43 සහ 2003.01.30 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක R7 (අඩි 30 ක් පළල පාර සඳහා වෙන් කරන ලද) සඳහා මායිම් : උතුරට : පාර සහ ලොට් 40, 42, R8, 43, 44, 45, 46, 47,

48, 49, 50, 51, 52, R9, 55, 56, 57, 58, 59, 60 සහ 61 ද, නැගෙනහිරට : ලොට් R 12 ද, දකුණට : ලොට් 62, 63, D8, 64,65, 66, 67, 68, 69, 70, R11, 80, 79, 78, 77, 76, 75, 74, 73, 39 සහ 38 ද, බටහිරට : ලොට් R6, 272625 සහ පිඹුරු අංක 1910 හි ලොට් 2 (අඩි 30 ක් පළල පාර) ද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම නවයයි තුනක් (පර්. 21.93) විශාල ඉඩම වේ. (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 557/37 හි ලියාපදිංචි වී ඇත) දැන් කඩුවෙල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 557/37 හි ලියාපදිංචි වී ඇත.)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 495 වෙල්ලන්ගිරිය ග්‍රාම නිලධාරී වසම තුළ හෝකන්දර දකුණ පිහිටි ‘‘ වෙල්ලන්ගිරිය එස්ටේට්’’ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. ටී. මාදොළ විසින් මැන සාදන ලද අංක 2003/43 සහ 2003.01.30 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක R11 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කරන ලද) සඳහා මායිම් : උතුරට ලොට් R7, 70, 71, 72, 63 සහ 62 ද, නැගෙනහිරට : ලොට් R12 ද, දකුණට : ලොට් 92, 91, 90, 89, 88, 87, 86, 85 සහ 84 ද, බටහිරට : ලොට් 84, R10, 80, R7 ද යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විසි නවයයි දශම දෙකයි අටක (පර්. 29.28) ප්‍රමාණයෙන් විශාල ඉඩම වේ. (මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B163/73 හි ලියාපදිංචි වී ඇත. දැන් කඩුවෙල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 163/73 හි ලියාපදිංචි වී ඇත.)

*ගෙවීමේ ක්‍රමය .-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතුය.
2. ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුලත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය.

රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කඩුවෙල.

වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 04 වැනි දින දී ය.

11-172

---

## විවිධ දැන්වීම්

### වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ (කොළඹ දී පැවැත්වෙන) මහාධිකරණයේ (සිවිල්) දී ය

ඇවර කිරීමේ දැන්වීමයි

නඩු අංක : HC (Civil) 49/2024 CO
ස්වභාවය : සමාගම **(ඇවර කිරීම)**
වටිනාකම : 19,930,300

දෙහිවල, දුටුගැමුණු වීදියේ, අංක 33/1 දරන ස්ථානයේ පිහිටි බී. ආර්. ජේ. ඩබ්ලිව්, එන්ටප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ ඉල්ලීමකි.

සහ

1939 ඇවර කිරීමේ රීති සමග කියවිය යුතු 2007අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ඇවර කිරීම සඳහා වූ ඉල්ලීමකි.

සරත් ජයසෝම ලියනගේ,
අංක 19, 9 වන හරස් පටුමග,
බොරුපන පාර, රත්මලාන.

..................*පෙත්සම්කරු.*

ඉහත නම සඳහන් සමාගම වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වර්ෂ **2024.07.29** දිනැති සංශෝධනය පෙත්සමක් රත්මලාන, බොරුපන පාර, 9 වන හරස් පටුමගේ අංක 19 හි සරත් ජයසෝම ලියනගේ විසින් වාණිජ අධිකරණයට ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම 2024 දෙසැම්බර් 19 වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණ බවත්,

එම පෙත්සමට අදාළ නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැලකර සිටීමට අපේක්ෂා කරන එම සමාගමේ ණය හිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා පුද්ගලිකව හෝ සිය නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේ දී පෙනී සිටිය හැකි බවත් එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

කුමුදු රාජපක්ෂ
කොන්සිලියම් ඇටර්නිස්,
අංක : 1395/5, හෝකන්දර පාර,
පන්නිපිටිය.

*සටහන* : එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත්, එසේ අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් කුමුදු රාජපක්ෂ වෙත ගෙනවිත් භාරදිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම් එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද, සඳහන් කොට ඒ අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙක් වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත **වර්ෂ 2024 දෙසැම්බර් මස 18 වෙනි දින පස්වරු 6.00** ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාරදිය යුතුය. නැතහොත් එපරිදි ම තැපෑලෙන් එවිය යුතුය.

කුමුදු රාජපක්ෂ,
කොන්සිලියම් ඇටර්නිස්,
අංක : 1395/5, හෝකන්දර පාර,
පන්නිපිටිය.

11-179

---

**බස්නාහිර පළාතේ කොළඹ මහාධිකරණයේ දී ය. (සිවිල්/වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම)**

අධීක්ෂණයට යටත්ව විසුරුවා හැරීම සඳහා වන නියෝගය

2024 නොවැම්බර් මස 06 වන බදාදා දින

නඩු අංක : CHC/82/2019/CO
ස්වභාවය : විසුරුවා හැරීම
කාර්ය පටිපාටිය : ලඝු
වටිනාකම : රු. 1,000,000.00

කොළඹ 07, ධර්මපාල මාවත, අංක 245 දරන ලිපිනයේ පිහිටුවා ඇති ටී. කේ. එස්. ෆිනෑන්ස් ලිමිටඩ් සම්බන්ධයෙන්,

*සහ*

2007 දී අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකණයෙන් විසුරුවා හැරීම සම්බන්ධයෙන් වන අයැදුමයි.

ටී. කේ. එස්. ෆිනෑන්ස් ලිමිටඩ්

අංක **245,** ධර්මපාල මාවත,

කොළඹ **07**.

*................පෙත්සම්කරු.*

මෙම පෙත්සම සහ ඇ. අනුකූලව ඉහත සඳහන් ටී. කේ. එස්. ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම ස්වේච්ඡාවෙන් මෙම අධිකරණයේ අධීක්ෂණයට යටත්ව විසුරුවා හැරීම අඛණ්ඩව සිදු කරනු ලබන බවට මෙම අධිකරණය විසින් නියෝග කරනු ලැබේ. ඉහත කී ස්වේච්ඡා විසුරුවා හැරීම යටතේ සිදු වන ඕනෑම ක්‍රියාදාමයක් අධිකරණය සුදුසු යැයි සිතන පරිදි සම්මත කර ගත හැක. එකී සමාගම ස්වච්ඡාවෙන් විසුරුවා හැරීමේ දී පත් කරන ලද ඇවරකරු හෝ දැනට වෙනත් ඇවරකරු පත් කිරීම ලබන 2024 දෙසැම්බර් 02 වන දින සිදුකරන ලෙසත්, මෙතැන් සිට සෑම මාස තුනකට වරක් ම සමාගම විසුරුවා හැරීමේ තත්ත්වය සහ එහි ප්‍රගතිය පිළිබඳව, සහ එහි දේපළවල ආදායම් ප්‍රකෘතිය පිළිබඳව, අධිකරණය විසින් වරින් වර නියම කළ හැකි පරිදි විසුරුවා හැරීම හා සම්බන්ධ වෙනත් කාරණා සම්බන්ධයෙන් ලිඛිත වාර්තාවක් අධිකරණ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. තවද සමාගමේ දේපළවලින් ගෙවීම් කිරීම සඳහා සංකල්පිත රිසි ප්‍රමාණය, ආයෝජනය, වියදම් ගාස්තු, හෝ සමාගමේ ඇවරකරු විසින් පත් කරන ලද නියෝජිතයකුගේ විශේෂ දීමනාව, හෝ ඇවරකරුගේ, කළමනාකරුගේ, ගණකාධිකාරීවරයෙකුගේ, වෙන්දේසිකරුගේ, තැරුව්කරුගේ, හෝ වෙනත්

පුද්ගලයකුගේ ගාස්තු, දීමනා හෝ වියදම් අධිකරණ ලේකම්ගෙන් විමසා සම්මත කළ නොහැකි නම් ඒවා සමාගමේ දේපළවලින් ගෙවිය නොහැකි බවට නියෝග කරනු ලැබේ.

එසේම මෙම සියලුම ගාස්තු, ආයෝජන, වියදම් සහ දීමනා නිසි ලෙස තක්සේරු කර තීරණය කළ යුතු අතර එය පෙත්සම්කරුගේ පිරිවැය වන බවට නියෝග කරනු ලැබේ. එම සමාගමේ ණයහිමියන්, දායකයින්, ඇවරකරුවන්, සහ සම්බන්ධිත අනෙකුත් සියලු පුද්ගලයින් විසින් අවශ්‍යතාවයට අනුව සාමාන්‍යයෙන් අයදුම් කිරීමට නිදහස ලබා දී තිබේ.

පෙත්සම්කරුගේ නීතිඥ.

11-186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.